සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**<u>අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

අංක 2088/26 හා 2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.11.3.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ ( අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) I ශ්‍රේණියේ නිලධරයන්ගෙන් අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. සුදුසුකම්

i. I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. උසස්වීම් දිනයට පූර්වාසන්නයේ වූ වසර 05 තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර එම කාලයට අදාලව වැටුප් වර්ධක පහ (05) උපයා ගෙන තිබීම.

iii. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

03. 2021.01.01 වන දිනට ඉහත 2 ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කල නිලධරයන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සමග එකී ව්‍යවස්ථා සංග්‍රහයේ ' ඇමුණුම 07' හි සඳහන් ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍ර 2021.03.15 දිනට පෙර '**ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.**' ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ '**අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම**' යන්න සඳහන් කල යුතුය.

04. අයදුම්පත්‍ර එවනු ලබන නිලධරයන් විසින් සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු, පවතින පුරප්පාඩු සංඛ්‍යාව සළකා බලා ජ්‍යෙෂ්ඨතාවය සහ/ හෝ කුසලතාවයද සළකා බලා උසස් කිරීම් සිදු කරනු ලබන අතර එසේ උසස්වීම් ලබන නිලධාරීන් ව්‍යවස්ථා සංග්‍රහයේ "ඕ" පරිශිෂ්ඨයෙහි අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ තනතුරු නාමාවලිය යටතේ සඳහන් අධිකරණයක පමණක් සේවය කිරීමට යටත් වේ.

05. කුමන හේතුවක් නිසාවත් මෙම කාර්යාලයට එවනු ලබන අනෙකුත් ලේඛන සමග අයදුම්පත් නොඑවිය යුතු අතර අයදුම්පත් සමඟ ඊට අදාල සනාථ කරන ලද සහතික පමණක් එවිය යුතුය. මෙම උපදෙස් නොසලකා එවනු ලබන අයදුම්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් වගකියනු නොලැබේ. නියමිත දිනට පසුව එවන අයදුම්පත් හා නිසි අයුරින් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මෙම ලිපිය ඔබ අධිකරණයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ ( අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) I ශ්‍රේණියේ නිලධරයන්ට දැන ගැනීමට සලස්වන්න.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2021 පෙබරවාරි මස 02 වන දින.
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12